# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1981/79 - 2016 අගෝස්තු මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2016.08.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/1978(xi)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු 91 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලබන නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2016 අගෝස්තු මස 24 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මේ නියමාවලිය 2016 අංක 1 දරන විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු බලාත්මක විය යුතු ය.

2. 2015 මාර්තු මස 17 වැනි දින අංක 1906/8 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 2015 අංක 1 දරන විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල නියමාවලිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) 6 වන ඡේදයේ 3(අ) වන අනු-ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අනු-ඡේදය ආදේශ කිරීමෙන් :-

"(අ) කොමිෂන් සභාවේ උප සභාපතිවරයා ;";

(2) 10 වන ඡේදයේ -

(අ) (2)(අ) අනු-ඡේදයේ (i) වන අයිතමය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතිමය ආදේශ කිරීමෙන් :-

"(i) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ ඔහුගේ නාමිකයෙකු ;";

(ආ) (2)(ආ) අනු-ඡේදයේ (ii) වන අයිතමය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :-

"(ii) කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ උපසභාපතිවරයා විමසා ලේකම්වරයා විසින් නම් කරනු ලබන තැනැත්තන් තිදෙනෙකු අතරින් කොමිෂන් සභාව විසින් තෝරාගනු ලබන ආර්ථික විද්‍යාව, කළමනාකරණය හෝ මුදල් පරිපාලනය යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයක පුළුල් අවබෝධයක් ඇති අරමුදලේ දායකයකු ;".

09-382